# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.09.27 |

## ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - අගෝස්තු 2023

**ඉදිකිරීම් කටයුතුවල පවතින දුර්වල ක්‍රියාකාරිත්වය හමුවේ වුවද, සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය 47.0ක අගයක් වාර්තා කරමින් කඩඉම් මට්ටම කරා ආසන්න විය.** මෙහිදී, පවතින සීමිත ව්‍යාපෘති සඳහා ඇති අධික තරඟකාරී ටෙන්ඩර් ලංසු තැබීම් හමුවේ, සිය මිල ගණන් පහත දැමීමට සිදුවී ඇති බව සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී.

නව ව්‍යාපෘති නොමැති වීම ඉදිකිරීම් කර්මාන්ත කටයුතු සඳහා දැඩි අහිතකර බලපෑමක් සිදුකර ඇති බව, නව ඇණවුම්හි අඛණ්ඩ පහත වැටීමෙන් පිළිබිඹු වේ. තවද, දේශීය මෙන්ම විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති සීමිත වීම ඉදිකිරීම් කර්මාන්තයේ තවදුරටත් පවතින ප්‍රධාන ගැටලුවක් බව, සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. මෙම වාතාවරණය හමුවේ, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් ඉවත් කිරීමට ව්‍යාපාර නැඹුරු වී ඇති බව සේවා නියුක්තියේ අඛණ්ඩ පහත වැටීමෙන් පිළිබිඹු වේ. තවද, පසුගිය මාසයට සාපේක්ෂව තොග මිලදී ගැනුම් අඩු වේගයකින් පහළ යන ලදී. මේ අතර, සැපයුම්කරුවන්ට ලැබෙන ඇණවුම් සීමිත බැවින්, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසය තුළදී ද අඩු වී ඇත.

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **සමස්ත ක්‍රියාකාරකම්** | **43.2** | **47.0** | **+** | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| නව ඇණවුම් | 45.9 | 41.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 29.7 | 26.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 39.2 | 44.1 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 50.0 | 47.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කරමින්, සැප්තැම්බර් මාසයේ සිට නව ව්‍යාපෘති ආරම්භ කිරීමේ යම් ප්‍රවණතාවයක් දක්නට ලැබෙන බැවින්, ඉදිරි මාස තුන පිළිබඳ ව්‍යාපාර අපේක්ෂා යහපත් මට්ටමක පවතී.

**සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**
**2023 අගෝස්තු**
**47.0**

**ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය[1]

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගය පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

### විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්

සමස්ත ක්‍රියාකාරකම් : ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල සමස්ත පරිමාව. මෙය ජාත්‍යන්තර ක්‍රමවේදය අනුගමනය කරමින් "ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය" ලෙස හඳුන්වන මූලික දර්ශකය වන අතර එය කර්මාන්ත අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය හා සැසඳිය හැකි වේ..

සේවා නියුක්තිය: සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන.

තොග මිලදී ගැනුම්: නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන ගබඩා කර තැබීම.

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය: සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය.

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.

### සමීක්ෂණ ප්‍රතිචාර

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

[1]ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කර ඇත්තේ ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදකයා ලෙස හඳුනාගෙන ඇති ලොව පුරා ආර්ථිකයන් 40කට අධික සංඛ්‍යාවක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදනය කරනු ලබන එස්&පී ග්ලෝබල් (S&P Global) අනුගමනය කරනු ලබන ක්‍රමවේදය භාවිතයෙනි.